**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 03/2001**

මගේ අංකය : ආ1/6/12 පොදු
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07
2001.02. 24 දින

අමාත්‍යාංශ ලේකම්වරුන්
ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා
## යතුරුලියන රැගෙන යාමේ ගාස්තු

යතුරුලේඛක සේවයේ සහ ලඝුලේඛක සේවයේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා පෙනී සිටින නිලධාරීන්ට එම විභාග සඳහා යතුරුලියන රැගෙන යාමේදී වැයවන සත්‍ය වියදම් පදනම් කොටගෙන පහත සඳහන් පරිදි ගෙවීම් කල හැක.

දිස්ත්‍රික්කය තුල විභාග මධ්‍යස්ථානයකට - රු. 300/= (උපරිමය)
දිස්ත්‍රික්කයෙන් පිට විභාග මධ්‍යස්ථානයකට - රු. 500/= (උපරිමය)

02. මේ සඳහා වෙනත් ගමන් වියදමක් ප්‍රතිපූර්ණය නොකල යුතු අතර සංයුක්ත දීමනා පමණක් අදාල පරිදි ගෙවිය හැක.

03. මෙම ගෙවීම් කල හැක්කේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා පෙනී සිටින ප්‍රථම අවස්ථාව සඳහා පමණකි.

04. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිවය.

එම්.එන්.ජුනයිඩ්
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය